සාමාන්‍ය සමය තිස්තුන්වන ඉරුදින

දේව ප්‍රකාශන

17-11-13

## පළමුවන කියැවීම

මලාකි 4:1-2

මලාකි දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් උපුටා ගත් පාඨයෙකි.

**ධර්මිෂ්ඨකම නමැති සූර්යයා උදාවන්නේ ය.**

සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක: ''උඩඟු අය ද නපුරු අය ද පිදුරු පෝරණුවක දැවෙන්නාක් මෙන් දැවී යන දවසක් පැමිණෙන්නේ ය. ඒ දවසේ දී කිසිවෙක් ඉතිරි නොවන සේ දැවී යන්නෝ ය. එහෙත්, මාගේ නාමයට ගරුබිය දක්වමින්, ජීවත්වන නුඹලාට ධර්මිෂ්ඨකම නමැති සූර්යයා සිය රැස්වල සුවසහනය ඇති ව උදාවන්නේ ය.

දේව වාක්‍යය එසේ ය.

දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 98:5-9

පිළිතුර: සමිඳාණෝ ලෝ වැසියන් සාධාරණකමින් පාලනය කරන සේක.

ගීය: වීණාව වයමින් සමිඳුන්ට ගී ගයන්න: වීණාවෙන් ද ගී නාදයෙන් ද ප්‍රශංසා කරන්න. හොරණෑ හා නළා හඬින් ද රජාණන් වන සමිඳුන් අබිමුව ප්‍රීතියෙන් ගී ගයන්න.

මුහුද ද එහි ඇති සියල්ල ද ගර්ජනා කෙරේ වා! ලෝකය ද එහි වැසියෝ ද ගී ගයත් වා! ගංගා අත් පොළසන් දේ වා! කඳු හෙල් එක් ව සමිඳුන් හට ප්‍රීති නාද දේ වා!

මන්ද, සමිඳාණෝ මිහිතලය පාලනය කරන පිණිස වඩින සේක: එතුමාණෝ ලෝ වැසියන් ධර්මිෂ්ඨකමින් ද සාධාරණකමින් ද පාලනය කරන සේක.

## දෙවන කියැවීම

2 තෙසලෝනික 3:7-12

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද දෙවන හසුනෙන් ගත් කොටසකි.

**''වැඩ නොකරන්නෝ ආහාර නොවළඳත් වා!''**

අපේ ආදර්ශය ඔබ අනුගමනය කළ යුත්තේ කෙසේ දැ යි ඔබ ම දන්නහු ය. අප ඔබ අතර අලසකමින් හැසුරුණේ නැත. අපි කිසිවෙකුගෙන් පිනට කෑම නොකෑවෙමු. ඔබෙන් කිසිවෙකුට බරක් නො වන පිණිස, අපි වෙහෙස මහන්සියෙන් දිවා රෑ දෙක්හි වැඩ කළෙමු. අප මෙය කෙළේ ඔබෙන් ආධාර ලැබීමට අපට අයිතියක් නැති නිසා නොව, අනුගමනය කිරීම සඳහා ඔබට ආදර්ශයක් දෙන පිණිස ය. ''වැඩ නොකරන්නෝ ආහාර නොවළඳත් වා''යි අපි ඔබ අතර සිටිය දී පවා ඔබට අණ කෙළෙමු. ඔබෙන් සමහරෙකු කිසි වැඩක් නොකර, අනුන්ගේ කාරණාවලට ඇඟිලි ගසමින් අලසකමින් හැසිරෙන බව අපට සැළ වී ඇත. එබඳු අය සන්සුන් ලෙස වැඩ කොට, සිය දිවි පෙවෙත උපයාගන්නා ලෙස ජේසුස් ක්‍රිස්තුස් ස්වාමීන් වහන්සේගේ නාමයෙන් අණ දී අවවාද කරමු.

දේව වාක්‍යය එසේ ය.

දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සාධුකාරය

ලූක් 21:28

**ආලේලූයියා ! ආලේලූයියා !**

**ඔබේ විමුක්තිය ළං වේගෙන එන බැවින්**

**නැගී සිට හිස ඔසවන්නැයි සමිඳාණෝ වදාරන සේක.**

**ආලේලූයියා !**

## ශුද්ධවූ සුවිශේෂය

ලූක් 21:5-19

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**''ස්ථිර ව සිටීමෙන් ඔබ ජීවනය දිනා ගන්නහු ය.''**

සමහරුන් දේව මාලිගාව ගැන කතා කරමින්, එය මනහර ගලින් හා පූජා වස්තුවලින් ද සරසා තිබෙන නියාව පැවසූ විට උන් වහන්සේ කතා කොට, ''ඔබට පෙනෙන මේ දෙය, ගලක් පිට ගලක් ඉතිරි නොවන සේ බිඳ දමනු ලබන කාලයක් පැමිණෙන්නේ ය''යි වදාළ සේක.

''ගුරුදේවයෙනි, ඒ දෙය කවර කලෙක වන්නේ ද? ඒ පිළිබඳ පෙර ලකුණු කවරේ දැ''යි ඔව්හු උන් වහන්සේගෙන් ඇසූ හ. උන් වහන්සේ කතා කොට, ''මුළා නොවෙන්ට බලාගන්නඃ කුමක් නිසා ද මාගේ නාමයෙන් බොහෝ දෙනෙක් ඉදිරිපත් වී 'ඒ මම ය, නියමිත මොහොත පැමිණ ඇතැ'යි කියන්නෝ යඃ ඔවුන් අනුව නොයන්න. යුද්ධ සහ විප්ලව ගැන ආරංචි වන විට, භයින් ත්‍රස්ත නොවන්නඃ මන්ද, මේ දේවල් පළමුකොට සිදුවිය යුතු යඃ එහෙත් අවසානය එකෙණෙහි ම නොපැමිණෙන්නේ ය''යි වදාළ සේක.

එවිට උන් වහන්සේ ඔවුන්ට කතා කොට, ''ජාතියක් ජාතියකට විරුද්ධ ව ද රාජ්‍යයක් රාජ්‍යයකට විරුද්ධ ව ද නැඟිටිනු ඇත. මහා භූමිකම්පා ද නොයෙක් තැන්වල සාගත හා වසංගත ද වන්නේ යඃ ත්‍රාසජනක දර්ශන ද පුදුම ලකුණු ද අහසෙහි වන්නේ ය. එහෙත් ඒ සියල්ලට පෙර, මාගේ නාමය නිසා ඔව්හු ඔබ අල්ලාගෙන, ධර්මශාලාවටත්, හිර ගෙවලටත් ඔබ පාවාදෙමින්, ඔබට පීඩා කරන්නෝ යඃ ඔබ රජුන් හා ආණ්ඩුකාරයන් ඉදිරියට ගෙන යන්නෝ ය. ඔබට එය සාක්ෂි දැරීමේ අවස්ථාවක් වන්නේ ය. ඔබ වගඋත්තර දිය යුත්තේ කෙසේ දැ යි කල් තියා සූදනම් නොවන්නට සිතට ගන්න. මන්ද, ඔබගේ විරුද්ධවාදීන් කිසිවෙකුට නොබිඳිය හැකි වූ ද නිෂ්ප්‍රභා කළ නොහැකි වූ ද වාග් චතුරතාවක් හා ප්‍රඥාවක් මම ඔබට දෙන්නෙමි. දෙමවුපියන්, සහෝදරයන් හා නෑ මිතුරන් විසින් ම ඔබ පාවා දෙනු ලබන්නහු යඃ ඔව්හු ඔබගෙන් සමහරෙකු මරණයට පත් කරන්නෝ ය. මාගේ නාමය නිසා සියල්ලෝ ම ඔබට වෛර කරන්නෝ ය. එහෙත් ඔබගේ කෙස් ගහක් පමණ වත් නාස්ති නොවන්නේ ය. ස්ථිර ව සිටීමෙන් ඔබ ජීවනය දිනා ගන්නහු ය.''

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

**ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා [http://www.sinhalagospel.lk/](http://www.sinhalagospel.lk/) වෙත පිවිසෙන්න.**